NALANDA COLLEGE NALANDA COLLEGE

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

11 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | ඒකකය 3 - මානව හිමිකම් හා යුතුකම්

- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) එක්සත් ජාතීන් විසින් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කරගනු ලැබුවේ,
1) 1948 දෙසැම්බර් 10 2) 1945 දෙසැම්බර් 10
3) 1949 දෙසැම්බර් 10 4) 1945 දෙසැම්බර් 10 දිනය

(2) එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් වගන්ති වලින් පිළිගැනෙන සරල බසින් දක්වා ඇති අයිතිවාසිකම් ගණන වනුයේ,
1) 35 කි 2) 33 කි 3) 30 කි 4) 3 කි

(3) පහත දැක්වෙන මානව අයිතිවාසිකම් අතුරින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකමක් වන්නේ,
1) නිදහස් මත දැරීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය
2) සමාජ ආරක්ෂණයට ඇති අයිතිය
3) අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
4) පෞද්ගලික දේපළ දැරීමට ඇති අයිතිය

(4) එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සම්මත කරගනු ලැබුවේ,
1) 1989 නොවැම්බර් 20 2) 1991 නොවැම්බර් 20
3) 1924 ජුනි 20 4) 1989 ජුනි 20

(5) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය අනුව ළමයෙකු ලෙස පිළිගැනෙන වයස සීමාව වන්නේ,
1) වයස අවු. 18 ට අඩු දරුවන් 2) වයස අවු. 21 ට අඩු දරුවන්
3) වයස අවු. 12 ට අඩු දරුවන් 4) වයස අවු. 06 ට අඩු දරුවන්

(6) ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ලෝක කම්කරු සංවිධානය විසින් ආදිවාසී හා ගෝත්‍රික ජනතාව පිළිබඳ සම්මුතිය හඳුන්වා දෙනු ලැබුයේ,
1) වර්ෂ 2000 දීය 2) වර්ෂ 1989 දීය 3) වර්ෂ 1948 දීය 4) වර්ෂ 2006 දීය

(7) ශ්‍රී ලංකාව අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සාමාජිකත්වය ලබාගත් වර්ෂය වන්නේ,
1) වර්ෂ 1948 දීය 2) වර්ෂ 1972 දීය 3) වර්ෂ 1946 දීය 4) වර්ෂ 1989 දීය

(8) පහත යුතුකම් අතරින් නීතිමය යුතුකමක් වන්නේ,
1) වැඩිහිටියන්ට සැලකීම 2) ජාතික සම්පත් සුරැකීම
3) පොදු දේපළ ආරක්ෂා කිරීම 4) පරිසරය සුරැකීම

(9) මූලික අයිතිවාසිකම් පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මුල්වරට ඇතුළත් කරනු ලැබුවේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද?
1) 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව 2) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව
3) 1931 ඩොනමෝර් ව්‍යවස්ථාව 4) 1920 මැනිං ව්‍යවස්ථාව

(10) අ හා ආ තීරු නිවැරදිව ගලපා පිළිතුරට අයත් අක්ෂර කාණ්ඩය නම් කරන්න.

| අ | ආ |
|---|---|
| මැග්නා කාර්ටා ගිවිසුම | A ක්‍රි. ව. 1917 |
| රුසියානු විප්ලවය | B ක්‍රි. ව. 1776 |
| ඇමරිකානු නිදහස් ප්‍රකාශනය | C ක්‍රි. ව. 1689 |
| බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත | D ක්‍රි. ව. 1215 |

1) DABC 2) ABDC 3) DBCA 4) CDAB

- **ප්‍රශ්න අංක 11 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

(11) පළමු ලෝක සංග්‍රාමය හා දෙවන ලෝක සංග්‍රාමය පැවති කාල සීමාව ලියා දක්වන්න.

(12) ලෝක සංග්‍රාමවල ප්‍රතිඵල 4 ක් ලියන්න.

(13) අයිතිවාසිකම් හා සම්බන්ධ ක්‍රියාවලිය සමන්විත වන කරුණු දෙක දක්වන්න.

(14) මානව අයිතිවාසිකම් සුරකින සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ 2 ක් ලියන්න.

(15) ආර්ථික, සමාජීය හා සංස්කෘතික ලක්ෂණ දෙකක් ලියන්න.

(16) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් වී ඇති මූලධර්ම හතර නම් කරන්න.

(17) ළමා අයිතිවාසිකම් සම්මුතිය මගින් සහතික කර ඇති ළමා අයිතිවාසිකම් තුනක් ලියන්න.

(18) ආබාධ සහිත පුද්ගලයන්ගේ ගරුත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් සමාජයෙන් ඉටු විය යුතු යුතුකම් තුනක් ලියන්න.

(19) පවුලේ සාමාජිකයකු වශයෙන් වැඩිහිටියකුට තෘප්තිමත් සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් දෙකක් ලියන්න.

(20) පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආයතන / දෙපාර්තමේන්තු 3 ක් ලියන්න.

- **පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

(1)
- i) මානව අයිතිවාසිකම් යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
- ii) ළමා අයිතිවාසිකම් උල්ලංගනය වන අවස්ථා 3 ක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
- iii) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග 3 ක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

(2)
- i) එක්සත් ජාතීන් විසින් සම්පාදනය කරන ලද ප්‍රධාන නීතිමය ලේඛන 6 න් දෙකක් ලියන්න.
- ii) කාන්තාව සම්බන්ධයෙන් ලිච්ඡවී රජ දරුවන් අනුගමනය කළ චාරිත්‍ර ධර්ම දෙකක් ලියන්න.
- iii) සීඩෝ (CEDAW) සම්මුතිය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(3)
- i) ආබාධ සහිත පුද්ගලයන්ට යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා රජය මගින් සලසා ඇති පහසුකම් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.
- ii) කම්කරු අයිතිවාසිකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සම්මත කර ක්‍රියාත්මක කරන අණ පනත් තුනක් ලියන්න.
- iii) පාසල් සාමාජිකයකු ලෙස අයිතිවාසිකම් ඔබෙන් පාසලට ඉටු විය යුතු යුතුකම් දෙකක් පැහැදිලි කරන්න.

සැකසුම:- අයි.ඩබ්.ඒ. අයෝමි මිය